වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2024

வருடாந்த செயலாற்றுகை அறிக்கை - 2024

Annual Performance Report - 2024



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
நிதிருபவ் பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
இலங்கை

DEPARTMENT OF CENSUS AND STATISTICS
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT
SRI LANKA

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංක 252

ඩී. ඩී. ජී. ඒ. සෙනෙවිරත්න
අධ්‍යක්ෂ ජනරාල්

2024 ஆம் ஆண்டுக்கான வருடாந்த செயலாற்றுகை அறிக்கை
தொகைமதிப்பு, புள்ளிவிபரத் திணைக்களம்
செலவின தலைப்பு இல.252

டி.டி.ஜி.ஏ. செனவிரத்ன
பணிப்பாளர் நாயகம்

Annual Performance Report for 2024
Department of Census and Statistics
Expenditure Head No. 252

D.D.G.A. Seneviratne
Director General


අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ නිල සංඛ්‍යාති පිළියෙල කරනු ලබන ප්‍රධාන ආයතනය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ විවිධ සංගණන, සමීක්ෂණ පැවැත්වීමෙන් සහ පරිපාලන වාර්තා මඟින් දත්ත රැස්කිරීම, සැකසුම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ දත්ත ප්‍රචලිත කිරීම වේ.

මෙම දත්ත සහ දර්ශකාංක රජයේ ප්‍රතිපත්ති සම්පාදනයට, ඉදිරි සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට, පවත්නා වැඩසටහන් ඇගයීමට සහ රටේ ආර්ථික සමාජීයීය වශයෙන් කාලීනව සිදුවන වෙනස්කම් අධ්‍යයනය කිරීමට යොදා ගනී. එමෙන්ම, රටේ එක් එක් ප්‍රදේශයන්හි ප්‍රජා විද්‍යාත්මක සමාජීය සහ ආර්ථික තත්ත්වයන් අතර පවත්නා සමාන, අසමානකම් අධ්‍යයනය කිරීමට සහ එම අසමානකම් අවම කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් සකස් කිරීමට සහ රටවල් අතර, ආර්ථික හා සමාජීය තොරතුරු සංසංදනය කිරීමට යොදා ගැනේ. මෙයට අමතරව, පර්යේෂණ ආයතන, අධ්‍යාපන ආයතන, මාධ්‍ය ආයතන හා විවිධ පුද්ගලයින් විසින් විවිධ අවශ්‍යතා සඳහා මෙම දත්ත භාවිතා කරනු ලබයි. දත්ත රැස් කිරීම, සැකසුම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ දත්ත ප්‍රචලිත කිරීමට අදාළ සියලුම කටයුතු ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් සහ මාර්ගෝපදේශ අනුගමනය කරමින් සංඛ්‍යාලේඛන හා සංගණන ආඥා පනත්වලට යටත්ව සිදුකරනු ලබයි.

නිල සංඛ්‍යාති පිළියෙල කිරීමට අමතරව, සංඛ්‍යාන සේවය අවශ්‍ය වන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංඛ්‍යාන උපදෙස් සේවාව ලබා දීම සහ විශේෂ සමීක්ෂණ පැවැත්වීමද දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.

2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව සහයෝගය ලබා දුන් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පුද කරන අතර, දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන කාර්යයන් සඳහා දත්ත ලබා දීම මඟින් සහ නන් අයුරින් සහයෝගය ලබා දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන සහ මහජනතාවට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරමි.



ඩී. ඩී. ජී. ඒ. සෙනෙවිරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
“සංඛ්‍යාන මන්දිරය”
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල.
2025 ජූනි
දුරකථන අංකය: +94 11 2147001
ෆැක්ස්: +94 11 2147011
විද්‍යුත් ලිපිනය: census@statistics.gov.lk
වෙබ් අඩවිය: ww.statistics.gov.lk

பணிப்பாளர் நாயகத்தின் செய்தி

இலங்கையில் உத்தியோகபூர்வ புள்ளிவிபரங்களை தயாரித்து வழங்குவதற்குபொறுப்பான முதன்மை நிறுவனமாக தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் மற்றும் நிர்வாக பதிவுகள் மூலம் தரவுகளை சேகரித்தல், செயன்முறையாக்குதல், பகுப்பாய்வு செய்தல் மற்றும் பரப்புதல் ஆகியவை இதன் முக்கிய செயற்பாடுகளில் அடங்கும். இந்த தரவு மற்றும் புள்ளிவிபர குறிகாட்டிகள் அரசாங்கக் கொள்கைகளை வடிவமைப்பதிலும், எதிர்காலஅபிவிருத்தித்திட்டங்களைத்திட்டமிடுவதிலும்,நடந்துகொண்டிருக்கும்முன்னெடுப்புகளை மதிப்பிடுதல் மற்றும் நாடு முழுவதும் நிகழும் பொருளாதார மற்றும் சமூக மாற்றங்களைக் கண்காணிப்பதிலும் முக்கிய பங்கு வகிக்கின்றன. அவை பிராந்தியங்களுக்கு இடையேயான சமூக-பொருளாதார நிலைமைகளை ஒப்பிடுவதையும், ஏற்றத்தாழ்வுகளைக் கண்டறிந்து அவற்றைக் குறைப்பதை நோக்கமாகக் கொண்ட இலக்குத் திட்டங்களின் அபிவிருத்திக்கு வழிகாட்டுவதையும் செயற்படுத்துகின்றன. மேலும், பொருளாதார மற்றும் சமூகப் போக்குகளின் நாடளாவிய ஒப்பீடுகளைச் செய்வதற்கு இந்தத் தகவல் அவசியமானதாகும்.

அரசாங்க பயன்பாட்டிற்கு அப்பால், இந்த புள்ளிவிபரங்கள் ஆராய்ச்சி நிறுவனங்கள், கல்வி நிறுவனங்கள், ஊடக நிறுவனங்கள் மற்றும் பொதுமக்களால் பல்வேறு நோக்கங்களுக்காக பரவலாகப் பயன்படுத்தப்படுகின்றன. தரவு சேகரிப்பு, செயலாக்கம், பகுப்பாய்வு மற்றும் பரப்புதல் தொடர்பான அனைத்து நடவடிக்கைகளும் தொகைமதிப்பு மற்றும் புள்ளிவிபர கட்டளைச் சட்டத்தின்படி, சர்வதேச அளவில் அங்கீகரிக்கப்பட்ட முறைகள் மற்றும் தரநிலைகளைப் பின்பற்றி மேற்கொள்ளப்படுகின்றன.

புள்ளிவிபரப் பொறுப்புகளுக்கு மேலதிகமாக, இந்தத் திணைக்களம் பயிற்சித் திட்டங்களை நடத்துகிறது, புள்ளிவிபர ஆலோசனை சேவைகளை வழங்குகிறது மற்றும் புள்ளிவிபர ஆதரவு தேவைப்படும் அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்களுக்கு விசேட ஆய்வுகளை மேற்கொள்கிறது. 2024 ஆம் ஆண்டிற்கான எமது இலக்குகளை அடைவதில் பொறுப்பான மற்றும் அர்ப்பணிப்புடன் கூடிய முயற்சிகளில் முக்கிய பங்கு வகித்த திணைக்களத்தின் அர்ப்பணிப்புள்ள ஊழியர்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். மதிப்புமிக்க தகவல்களை வழங்கிய மற்றும் திணைக்களத்தின் புள்ளிவிபர முயற்சிகளுக்கு தங்கள் உறுதியான ஆதரவை வழங்கிய அரச, தனியார் துறை நிறுவனங்கள், ஏனைய அமைப்புகள் மற்றும் பொதுமக்களுக்கும் எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.



டி.டி.ஜி.ஏ. செனவிரத்ன
பணிப்பாளர் நாயகம்
தொகைமதிப்பு, புள்ளிவிபரத் திணைக்களம்
“சங்கியான மந்திரய”
இல.306/71, பொல்துவ வீதி
பத்தரமுல்ல
2025 ஜூன்
தொலைபேசி இல :+94 11 2147001
தொலைநகல் :+94 11 2147011
மின்னஞ்சல்: dgcensus@statistics.gov.lk
இணையதளம்: www.statistics.gov.lk

MESSAGE FROM THE DIRECTOR GENERAL

The Department of Census and Statistics serves as the principal institution responsible for produing official statistics in Sri Lanka. Its core functions include the collection, processing, analysis, and dissemination of data through various censuses, surveys, and administrative records.

These data and statistical indicators play a vital role in shaping government policies, planning future development programs, evaluating ongoing initiatives, and monitoring the economic and social transformations occurring across the country. They also enable the comparison of socio-ecnomic conditions among regions, helping to identify disparities and guide the development of targeted programs aimed at reducing them. Furthermore, this information is essential for makingcross-country comparisons of economic and social trends.

Beyond government use, these statistics are widely utilized by research institutions, educational establishments, media organizations, and the general public for diverse purposes. All activities related to data collection, processing, analysis, and dissemination are carried out in accordance with the Census and Statistics Ordinance, following internationally recognized methodologies and standards.

In addition to its statistical responsibilities, the Department also conducts training programs, offers statistical advisory services, and carries out specialized surveys for government and non- governmental organizations that require statistical support.

I extend my heartfelt appreciation to the dedicated staff of the Department, whose responsible and committed efforts have been instrumental in achieving our objectives for the year 2024. I also wish to convey my sincere gratitude to the government, private sector institutions, other organizations, and members of the public who have contributed valuable information and extended their unwavering support to the Department's statistical endeavors.



D.D.G.A.Seneviratne
Director General
Department of Census and Statistics
"Sankyana Mandiraya"
No: 306/71, Polduwa Road,
Battaramulla.
June 2025
Tele.No. +94 11 2147001
Fax : +94 11 2147011
Email address: dgcensus@statistics.gov.lk
Website : www.statistics.gov.lk

අන්තර්ගතය

	පිටු අංක
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	7-11
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	12-13
පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය	14-26
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	27-44
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය	45-51
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	52-59
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	60-69
அத்தியாயம் 01 – நிறுவனத்தின் விவரம் /நிறைவேற்றுப் பொழிப்பு	70-75
அத்தியாயம் 02 – முன்னேற்றம் மற்றும் எதிர்கால கண்ணோட்டம்	76-77
அத்தியாயம் 03– வருடத்திற்கான ஒட்டுமொத்த நிதிச் செயலாற்றுகை	78-90
அத்தியாயம் 04 – செயலாற்றுகை குறிகாட்டிகள்	91-108
அத்தியாயம் 05 – நிலைபேறான அபிவிருத்தி இலக்குகளை (SDG) அடையும் செயலாற்றுகை	109-114
அத்தியாயம் 06 – மனித வள விபரம்	115-122
அத்தியாயம் 07– இணக்க அறிக்கை	123-133
Chapter 01 - Institutional Profile/Execution Summary	134-138
Chapter 02 – Progress and the Future Outlook	139-140
Chapter 03 –Financial Performance of the year	141-153
Chapter 04 - Performance indicators	154-171
Chapter 05 – Performance of achieving Sustainable Development Goals (SGD)	172-177
Chapter 06 - Human Resource Profile	178-185
Chapter 07– Compliance Report	186-195

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජනලේඛන හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ විවිධ සංගණන, සමීක්ෂණ පැවැත්වීමෙන් සහ පරිපාලන වාර්තා මගින් දත්ත රැස් කිරීම, සැකසුම් කිරීම, විශ්ලේශණය කිරීම සහ දත්ත ප්‍රචලිත කිරීම වේ. මෙම දත්ත සහ දර්ශකාංක රජයේ ප්‍රතිපත්ති සම්පාදනයට, ඉදිරි සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට, පවත්නා වැඩසටහන් ඇගයීමට සහ රටේ ආර්ථික සමාජීය වශයෙන් කාලීනව සිදුවන වෙනස්කම් අධ්‍යයනය කිරීමට, රටේ එක් එක් ප්‍රදේශයන්හි ප්‍රජා විද්‍යාත්මක සමාජීය සහ ආර්ථික තත්ත්වයන් අතර පවත්නා සමාන, අසමානකම් අධ්‍යයනය කිරීමට සහ එම අසමානකම් අවම කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් සකස් කිරීමට සහ රටවල් අතර ආර්ථික හා සමාජීය තොරතුරු සංසන්දනය කිරීමට යොදා ගැනේ. මෙයට අමතරව, පර්යේෂණ ආයතන, අධ්‍යාපන ආයතන, මාධ්‍ය ආයතන හා විවිධ පුද්ගලයින් විසින් විවිධ අවශ්‍යතා සඳහා මෙම දත්ත භාවිතා කරනු ලබයි. දත්ත රැස් කිරීම, සැකසුම් කිරීම, විශ්ලේශණය කිරීම සහ දත්ත ප්‍රචලිත කිරීමට අදාළ සියලුම කටයුතු ජාත්‍යන්තරව පිළිගත් සංඛ්‍යාලේඛන ක්‍රමවේදයන් අනුගමනය කරමින් සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන හා සංගණන ආඥා පනත් වලට යටත්ව සිදුකරනු ලබයි.

නිල සංඛ්‍යාති පිළියෙල කිරීමට අමතරව, සංඛ්‍යාන සේවය අවශ්‍ය වන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම හා සංඛ්‍යාන උපදේශන සේවාව ලබා දීමේ කටයුතු ද දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. එමෙන්ම, ශිෂ්‍යයන්, පර්යේෂකයින්, ජාත්‍යන්තර ආයතන මෙන්ම විවිධ දත්ත භාවිතා කරන්නන් ගේ ඉල්ලීම් සඳහා වූ පුළුල් පරාසයක දත්ත අවශ්‍යතාව දෙපාර්තමේන්තුව විසින් සපුරාලනු ලැබේ. දෙපාර්තමේන්තුව විසින් සංගණන හා සමීක්ෂණ පැවැත්වීම මඟින් තිරසාර සංවර්ධන ඉලක්ක ඇතුළු රටෙහි සමාජයීය හා ආර්ථික තත්ත්වයන් අධීක්ෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීමේ වගකීම ඉටු කරනු ලබයි. ඒ අනුව, කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා, වෙළඳාම, මිල, ජනගහනය, ජාතික ආදායම හා අනෙකුත් සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන ලබා දීම සඳහා, නිවැරදිව, විශ්වාසදායක හා යාවත්කාලීන දත්ත එක් රැස් කිරීමට, සම්පාදනය කිරීමට හා බෙදාහැරීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

- ජන හා නිවාස සංගණන මාලාවේ 15 වන සංගණනය 2021 වසරේ දී පැවත්වීමට සැලසුම් කළද ලංකාවේ මෙන්ම ගෝලීයව ද පැවති කෝවිඩ්-19 වසංගත තත්ත්වය සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වූ ආර්ථික පසුබෑම හේතුවෙන් 2021 වර්ෂයේ දී පැවත්වීමට සැලසුම් කළ ජන හා නිවාස සංගණනය 2024 දක්වා කල් දැමීමට සිදු විය.

- සංගණනයේ පළමු අදියර ලෙස සිතියම් සකස් කිරීම 2016 සිට 2020 දක්වා සිදු කරන ලදී දෙවන අදියර වන ගොඩනැඟිලි සහ සංගණන ඒකක ලැයිස්තුගත කිරීම 2023 ඔක්තෝබර් මස සිට 2024 ජනවාරි මස දක්වා සිදු කරන ලදී .තුන්වන අදියර ලෙස 2024 ඔක්තෝබර් මස 07 වන දින ආරම්භ වූ ගණන් ගැනීමේ අදියර සැලසුම් කර පරිදි 2024 දෙසැම්බර් 18 දින කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක හැර දිස්ත්‍රික්ක 23 ක අවසන් කරන ලදි. මෙම නාගරික ප්‍රදේශයන්හි පවතින සංකීර්ණතාව හේතුවෙන් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල ගණන් ගැනීම 2025 පෙබරවාරි මස දෙවන සතිය දක්වා පැවතුණි. මෙසේ තොරතුරු රැස් කිරීමේ කාර්යය සඳහා 40,000ක් පමණ ගණන් ගැනීමේ නිලධාරීන් සංඛ්‍යාවක් යොදවන ලදී. දෙසැම්බර් 19 දිනට යෙදුනු සංගණන දිනයට අනුව "සංගණන මොහොත" පදනම් කර ගනිමින් ගණන් ගැනීමේ තොරතුරු යාවත්කාලීන කිරීම සිදු විය.

- සාමාන්‍ය පදිංචියට ස්ථානයක් නොමැතිව එළිමහනේ ජීවත්වන "හිසට වහලක් නොමැති පුද්ගලයින් " ගණන් ගැනීම සංගණන මොහොත පදනම් කරගනිමින් 2024 දෙසැම්බර් මස 18 වන දින රාත්‍රියේ දී සිදු කරන ලදී.

- 2023 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කරන ලද, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය පිළිබඳ සංගණනය 2024 වර්ෂයේදී පවත්වන ලදී.

- කුටුම්භයන් ආර්ථික අර්බුදයට මුහුණ දුන් ආකාරය අවබෝධ කර ගැනීමට හා ආර්ථික අභියෝගයන්ට මුහුණ දීම සඳහා කුටුම්භයන් විසින් අනුගමනය කරන ලද උපාය මාර්ග පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා “ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය -2023” සිදුකිරීම. මුළු දිවයිනම ආවරණය කරමින් ගෘහ ඒකක 6,400 ක පමණ නියැදියක් භාවිතා කරමින් මෙම සමීක්ෂණය සිදුකරන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රධාන තොරතුරු ඇතුලත් සංක්ෂිප්ත වාර්තාව නිකුත් කරන ලද අතර විස්තරාත්මකව සමීක්ෂණ වාර්තාව 2024 වර්ෂයේ දී සකස් කිරීමට කටයුතු කරන ලදී.

2. රට තුල සමාජ ආර්ථික දත්ත එක් රැස් කිරීම (සාර්ව ආර්ථික දර්ශක) සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කල අනෙකුත් සංඛ්‍යනමය කටයුතු,

- ශ්‍රී ලංකාව සඳහා දළ දේශීය නිෂ්පාදිතය, ආර්ථික වර්ධන වේගය, මිල දර්ශකයන් සහ උද්ධමනය ඇතුළු සාර්ව ආර්ථික දර්ශක සකස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

- රටේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට අදාළ දර්ශක සකස් කිරීමට කටයුතු සිදු කිරීම.

3. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මඟින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

4. දේශීය හා විදේශීය දත්ත භාවිතා කරන්නන්ගේ දත්ත ඉල්ලීම්වලට අනුව අවශ්‍ය දත්ත සකස්කර ලබාදීමේ කටයුතු

- මෙහිදී දෙපාර්තමේන්තුව විවිධ සංගණන හා සමීක්ෂණ මඟින් රැස්කර ඇති සංඛ්‍යානමය තොරතුරු දෙපාර්තමේන්තුවේ දත්ත ලබාදීමේ ප්‍රතිපත්තියට අනුව සකස් කර ලබාදීම සිදුවේ. එහිදී අදාළ තොරතුරුවල රහස්‍යභාවය සුරැකෙන අයුරින් එම කටයුතු සිදු කරනු ලබයි.

1.4 සංවිධාන සටහන (ඇමුණුම 01)

මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය බත්තරමුල්ලෙහි පිහිටි ප්‍රධාන කාර්යාලයකින් හා දිවයින පුරා පිහිටි සංඛ්‍යාලේඛන අංශ සමුහයකින් සමන්විත වේ.

ප්‍රධාන කාර්යාලයේ අංශ හා ඒකක

ප්‍රධාන කාර්යාලයේ පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15ක් සහ විශේෂ ඒකක 03ක් මඟින් 2024 වසර තුළ අදාළ කාර්යයන් මෙහෙයවන ලදි. ප්‍රධාන කාර්යාලය අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වන අතර එම අංශය මඟින් දෙපාර්තමේන්තුවේ කටයුතු විගණනය කර සමහර ගැටළු සහිත අවස්ථාවල දී අදාළ විසඳුම් ලබාදෙමින් අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි.

තාක්ෂණික අංශ

1	වන අංශය	ජන සංගණන හා ප්‍රජා විද්‍යා
2	වන අංශය	කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා
3	වන අංශය	කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාති
4	වන අංශය	ජාතික ගිණුම්
5	වන අංශය	ප්‍රකාශන
6	වන අංශය	පුස්තකාල හා ප්‍රලේඛන
7	වන අංශය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ
8	වන අංශය	ආයතනික හා ගිණුම්
9	වන අංශය	නියැදි සමීක්ෂණ
10	වන අංශය	මුද්‍රණ
11	වන අංශය	ක්ෂේත්‍ර කළමනාකරණ
12	වන අංශය	පුහුණු
15	වන අංශය	පර්යේෂණ හා විශේෂ අධ්‍යයන
16	වන අංශය	මිල හා වේතන
18	වන අංශය	සිතියම් විද්‍යා

විශේෂ ඒකක

- දත්ත නිකුත් කිරීමේ ඒකකය
- සංඛ්‍යාන සංවර්ධනය හා ජාත්‍යන්තර සහයෝගිතා ඒකකය
- තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ ඒකකය

දිවයින පුරා පිහිටි සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල

ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් සභා කාර්යාලවල, දෙපාර්තමේන්තුවට අයත් සංඛ්‍යාලේඛන අංශ පිහිටුවා ඇති අතර දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 340ට අනුයුක්තව සංඛ්‍යාලේඛන නිලධාරීන් සේවය කරයි.

මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටි සංඛ්‍යාලේඛන අංශ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ භාරයේ පවතින අතර එම නිලධාරියාට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරීන්, සංඛ්‍යාලේඛන සහකාරවරුන්, සංවර්ධන නිලධාරිවරුන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් කිහිපදෙනෙක් අනුයුක්ත කොට ඇත. එක් එක් දිස්ත්‍රික්ක තුළ, දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන හා අනෙකුත් දත්ත රැස්කිරීමේ කටයුතු මෙම සංඛ්‍යාලේඛන අංශ මඟින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ හා ප්‍රධාන කාර්යාලය අතර සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේ ද මෙම දිස්ත්‍රික් කාර්යාල මඟිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන නිලධාරි හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීන් විසින් ක්ෂේත්‍රයේ දත්ත රැස්කිරීම සිදු කරයි.

මීට අමතරව විවිධ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ තුළ සංඛ්‍යාලේඛන අංශයක් ස්ථාපිත කර ඇති අතර දිවයින පුරා මෙවැනි ශාඛා කාර්යාල 57 ක් පවත්වාගෙන යනු ලබයි. මෙම සංඛ්‍යාලේඛන අංශ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛන නිලධාරිවරයෙකු යටතේ පවතී. සංඛ්‍යාලේඛන අංශය පිහිටි ආයතනයේ රාජකාරි සඳහා අවශ්‍ය සංඛ්‍යාලේඛන රැස්කිරීම, සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම මෙම ශාඛා කාර්යාල මඟින් සිදුවේ. ප්‍රධාන කාර්යාලය හා අදාළ ආයතන අතර සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම ශාඛා කාර්යාල මඟිනි.

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අදාළ නැත

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

අදාළ නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රු. 000

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	වැය විෂය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ව්‍යාපෘති කාලසීමාව
අන්තර් ජාතික ශ්‍රම සංඛ්‍යාලේඛනඥ වරුන්ගේ 19 වන සම්මේලනයේ දී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියමු සමීක්ෂණය (ICLS)	ලෝක බැංකුව	252-1-1-23-2507 (13)	37,000	2018 ජනවාරි - 2025 දෙසැම්බර්
පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ගෘහස්ථ අධ්‍යයනය	UNICEF	252-1-1-25-2507- (13)	19,800	2020 දෙසැම්බර්-2025 මාර්තු
UNFPA වාර්ෂික වැඩ සැලැස්ම 2023	UNFPA	252-1-1-29-2509 (13)	44,138	2023 ජනවාරි - 2025 දෙසැම්බර්
ආසියානු සහ පැසිෆික් ජාත්‍යන්තර මිල සංසන්දනාත්මක වැඩසටහන	ADB	252-1-05-2507(13)	10,257	2024 පෙබරවාරි-2026 පෙබරවාරි
ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය	WFP/WHO/UNDP	252-1-1-28-2507 (13)	15,449	2023 ජනවාරි - 2025 ජුනි

වෙනත් අමාත්‍යාංශ වෙනුවෙන් කරන ලද විදේශ ආධාර ලබන ව්‍යාපෘති රු.

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	වැය විෂය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ව්‍යාපෘති කාල සීමාව

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

පසුගිය වසර තුල දෙපාර්තමේන්තුව ලැබූ විශේෂ ජයග්‍රහණ රාශියකි. ඒවා පහත දැක්වේ.

- තිරසාර සංවර්ධන දර්ශක (SDG) කිහිපයක් අලුතින් ගණනය කිරීමට හැකිවීම හා තවත් දර්ශක කිහිපයක් ගණනය කිරීමට අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි කිහිපයක් (Modules) දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන සමීක්ෂණවලට එකතුකර ක්ෂේත්‍රයේ අදාළ දත්ත රැස්කිරීම සිදු කිරීම.

- වසර කිහිපයක් ප්‍රමාද වූ ජන හා නිවාස සංගණනයේ ගණන් ගැනීමේ අදියරයෙහි ක්ෂේත්‍ර කටයුතු ටැබ්ලට් පරිගණක සහ සුහුරු ජංගම දුරකථන භාවිතා කරමින් සිදුකිරීමට හැකිවීම .

- මිල දර්ශක ඇතුළු අනෙකුත් සංඛ්‍යාතීන් ඉදිරි දත්ත නිකුත් කිරීමේ කැලැන්ඩරයට අනුව ප්‍රකාශයට පත්කිරීම.

- දෙපාර්තමේන්තුව මඟින් දත්ත ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම හා සමාජ මාධ්‍ය භාවිතය ඇතුළු ක්‍රමවේද හරහා නිල සංඛ්‍යාති පිළිබඳව මෙන්ම භාවිතා කරනු ලබන සංකල්ප හා අර්ථ දැක්වීම් පිළිබඳව ද දත්ත භාවිතා කරන්නන් දැනුවත් කිරීමට පියවර ගැනිම.

- විවිධ පුද්ගලික සහ ආයතනික ක්ෂුද්‍ර දත්ත ගොනු ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් (අධ්‍යාපනය ලබන ප්‍රජාවගේ හා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වන ආයතනවල ක්ෂුද්‍ර දත්ත ඉල්ලීම් හැර) රු.මිලියන 9.57 ක පමණ ආදායමක් ලබා ගැනීමට හැකිවීම සහ මෙම අදායමෙන් 75% ක් පමණ මුදලක් විදේශ මුදල් ලෙස ලබා ගැනීමට හැකිවීම.

- කර්මාන්ත, වෙළඳ හා සේවා පිළිබඳව තොරතුරු රැස් කිරීමේ කටයුතු ආයතන වෙත මුද්‍රිත ප්‍රශ්නාවලින් ලබා දීම වෙනුවට විද්‍යුත් තැපෑල භාවිතා කරමින් සිදු කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

- සංඛ්‍යාලේඛන නිලධාරී හා සංඛ්‍යාලේඛනඥ තනතුරුවලට අදාළ කාර්යක්ෂමතා විභාග එකක් බැගින් පැවත්වීම.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ හා සංඛ්‍යාලේඛන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සංශෝධනය කිරීම.

- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා උසස්වීම් ලබා දීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

- විදේශ ආධාර මත සිදුකරන ලද සමීක්ෂණ හා සංගණන සඳහා ගෙවීම් අනුමැතිය ලබාගැනීම හා එම ව්‍යාපෘතීන් අවසන් කිරීමට කටයුතු කිරීම.

- සියලුම පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන සංවර්ධනය සඳහා උපායමාර්ගික සැලැස්ම කෙටුම්පත් කිරීම හා ජාත්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුකූලව සංඛ්‍යාන නීතිමය රාමුව කෙටුම්පත් කිරීම.

දෙපාර්තමේන්තුවේ අදාළ කටයුතු සිදු කිරීමේ දී මුහුණදීමට සිදුවූ අභියෝග කිහිපයකි.

- තාක්ෂණික හා අනෙකුත් සහයක සේවාවන්හි තනතුරුවල පුරප්පාඩු තව දුරටත් එසේම පැවතීම හා නිලධාරීන් විශ්‍රාමයාම හෝ නිවාඩු ලබා ගැනීම හේතුවෙන් පුරප්පාඩු ප්‍රමාණය තවදුරටත් ඉහල යාම.

- දෙපාර්තමේන්තුවේ දැනට පවතින නිලධාරි හිඟය මධ්‍යයේ අනෙකුත් තොරතුරු රැස් කිරීම් වලට බාධාවක් නොවන පරිදී ජන හා නිවාස සංගණනයේ කටයුතු සිදු කිරීම.

- දෙපාර්තමේන්තුවේ දැනට පවතින නිලධාරී හිඟය යටතේ වුවද සියළුම නිල සංඛ්‍යාති සකස් කිරීමේ කටයුතු නියමිත කාල වකවානු තුල සිදු කිරීම.

- ආර්ථික අභියෝග හේතුවෙන් 14/2022 චක්‍රලේඛ පරිදි විදේශීය රැකියා හා අනෙකුත් අවශ්‍යතා සඳහා වසර පහක් දක්වා නිවාඩු ඉල්ලුම් කිරීම (ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය හා විදේශීය රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම).

දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළව මුහුණ දීමට සිදුවන අභියෝග ජයගනිමින් පහත සඳහන් ඉදිරි ඉලක්ක කරා ළඟාවීමට අප බලාපොරොත්තු වේ.

- සියලුම පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කරමින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන සංවර්ධනය සඳහා වන උපාය මාර්ග සැලස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම.

- ජාතික සංඛ්‍යාන පද්ධතිය සඳහා වන නීති රාමුව අනුමත කර ගැනීම.

- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිය පිළිබඳ මූලික වාර්තාව සහ අවසන් වාර්තාව වාර්තාව නිකුත් කිරීම.

- සංඛ්‍යාලේඛන ක්ෂේත්‍රයේ සිදුවන දියුණුවීම් සහ වෙනස්කම් වලට අනුකූල වන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම.

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එසිජ්-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	කණ්ඩායම 2024	2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,294,832,786	1,855,787,961	එසිජ්-3
-	තැන්පතු		18,071,086	43,395,093	එසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		46,593,897	41,596,039	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		0	0	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,359,497,769**	**1,940,779,093**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,359,497,769**	**1,940,779,093**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**3,046,062**	**22,890,400**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**1,356,451,707**	**1,917,888,693**	
	අඩු කළා : වියදම්				
-	**ප්‍රතිසංස්කරණ වියදම්**		0	0	
1,030,256,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,023,999,207	895,242,428	
261,194,500	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	244,741,206	234,928,387	එසිජ්-2(ii)
8,534,500	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	8,450,707	9,640,112	
0	පොළී ගෙවීම්	8	0	0	
191,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	190,840	39,970	
1,300,176,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,277,381,960**	**1,139,850,897**	
	මූලධන වියදම්				
32,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	20,543,610	6,377,433	
104,250,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,855,147	1,643,612	
0	ප්‍රාග්ධන මාරුකිරීම්	12	0	0	එසිජ්-2(ii)
0	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	0	0	
5,000,000	හැකියා වර්ධනය	14	3,099,074	1,716,011	
1,312,710,602	වෙනත් මූලධන වියදම්	15	923,782,095	903,426,304	
1,454,460,602	**මුළු මූලධන වියදම් (උ)**		**953,279,926**	**913,163,360**	
	තැන්පතු ගෙවීම්		23,123,838	45,444,036	එසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		47,000,508	40,637,120	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		0	0	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**70,124,346**	**86,081,156**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**2,300,786,232**	2,139,095,413	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(944,334,525)**	**(221,206,720)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(944,334,525)	(221,206,720)	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		0	0	එසිජ්-3
			(944,334,525)	**(221,206,720)**	

3.3 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,791,286,071.00	3,767,150,424.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	110,003,025.00	109,596,414.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**3,901,289,096.00**	**3,876,746,838.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		107,148,943.00	101,689,581.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,791,286,071.00	3,767,150,424.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	2,854,082.00	7,906,833.00
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**3,901,289,096.00**	**3,876,746,838.00**

පිටු අංක……08….සිට …41…… දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක …42……. සිට …71……. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

…….	…….	…….
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
මහ.බැ.ප්‍රා.බැ.	දිනය : 2025.02.17	දිනය : 2025/02/17

මහනුවර භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

2

එෆිජ්-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තක්සා	
	2024 රු.	**2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	84,951,801	61,051,603
අග්‍රිම ලැබීම්	1,294,832,786	1,855,787,961
අත්තිකාරම් අයකර ගැනීම්	44,714,187	42,832,002
තැන්පතු ලැබීම්	18,071,086	43,395,093
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,442,569,860**	**2,003,066,659**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,221,747,509	1,080,432,614
සහනාධාර සහ මාරුකිරීම්	8,450,707	9,640,112
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	8,390,527	15,733,124
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,046,061	22,890,400
අත්තිකාරම් ගෙවීම්	46,709,558	40,637,120
තැන්පතු ගෙවීම්	23,123,838	45,444,036
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,311,468,200**	**1,214,777,406**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**131,101,660**	**788,289,253**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	131,101,660	788,289,253
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**131,101,660**	**788,289,253**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(131,101,660)**	**(788,289,253)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (අප දෙපාර්තමේන්තුවට අදාළ නොවේ)

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,200,370,000	1,300,176,000	1,277,381,960	98.20
ප්‍රාග්ධන	1,418,700,000	1,454,460,602	953,279,926	65.50

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජනාධිපති කාර්යාලය	ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සම්බන්ධ ක්‍රියාකාරකම් (HIES)	2,884,000.00	3,605,000.00	3,605,000.00	100
2	මැතිවරණ කොමිෂන් සභාව	ජනාධිපතිවරණ 2024/09/21 - මැතිවරණ කාර්යය මණ්ඩල ගෙවීම්	2,998,982.70	2,998,982.70	2,998,982.70	100
3	මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	සුභ සාධන ප්‍රතිලාභ අයදුම්කරුවන්ගේ ක්ෂේත්‍ර තොරතුරු ලබා ගැනීම සඳහා වන සංගණන පුහුණුවට ප්‍රතිපාදන ලබා දීම.	1,589,400.00	1,589,400.00	4,200.00	0.26

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය රු.000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	1,184,910	1,184,910	නැත	100
9152	යන්ත්‍රෝපකරණ	1,415,713	1,415,713		
9153	ඉඩම්	1,186,810	1,186,810		
9154	අස්පෘශ්‍ය වත්කම්	3,852	3,852	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TPD/D/DCS/02/24/01 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරි
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රභාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන

ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා 2011 වර්ෂයේ ණය සහන පදනම මත ලබා දී තිබූ යතුරුපැදි සඳහා අදාල ණය මුදල වාරික වශයෙන් අයකර ගැනීමෙන් පසුව නිලධාරීන්ගේ නමට පවරන ලද වටිනාකම රු. 1,370,000ක් වූ යතුරුපැදි 29ක් CIGAS ඉන්වෙන්ට්‍රියෙන් ඉවත් කිරීමට කටයුතුකර නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2020 අගෝස්තු මස 20 සහ 25 දිනවලදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් දෙපාර්තමේන්තුව වෙත පවරාදී තිබූ වටිනාකම රු. 12,000,000 ක් වූ වෑන් රථ දෙකක් CIGAS ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේදී පාරිභෝජන ද්‍රව්‍ය ලෙස හඳුනාගත යුතු එකතුව රු. 22,256,800 ක් වූ ගමන් මලු, එකතුව රු.9,276,323ක් වූ පොත්, වාර සඟරා සහ ජර්නල්, එකතුව රු.2,227,543ක් වූ විවිධ උපකරණ, එකතුව රු.349,824ක් වූ පරිගණක උපකරණ, එකතුව රු, 39,809ක් වූ විදුලි උපකරණ සහ එකතුව රු.11,550ක් වූ මදුරු දැල් යන මුළු එකතුව වූ රු.34,161,849 ක් වූ අයිතම ස්ථාවර වත්කම් ලේඛණයේ සටහන් කිරීම නිසා දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) ප්‍රතිපාදන උපයෝජනය

i. මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 113,013,179 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

ii. මූලධන වැය විෂයයන් 11 ක එකතුව රු. 1,335,991,297 ක් වූ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 388,167,489 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයය වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2 සිට සියයට 41 අතර පරාසයක පවතින බව නිරීක්ෂණය විය.

iii. පුනරාවර්තන වැය විෂයයන් 16 ක එකතුව රු. 660,485,000 ක් වූ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 19,775,749 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයය වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1 සිට සියයට 32 අතර පරාසයක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීමේ ප්‍රතිපාදන උපයෝජනය

i. වැය විෂයය අංක 23-2507(13) කම්කරු තෘප්තිය පිළිබඳ 19 වන ජාත්‍යාන්තර සම්මේලනය ක්‍රියාත්මක කිරීමේ නියමු අධ්‍යයනය සඳහා රු.15,013,179ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන උපයෝජනය නොකර සියයට 100 ක් ඉතිරි වී තිබුණි.

ii. වැය විෂයය අංක 25-2507(13) පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ගෘහ සමීක්ෂණය (යුනිසෙප්) සඳහා රු. 1,065,244ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එයින් රු. 391,244 ක් හෙවත් සියයට 37 ක් ඉතිරි වී තිබුණි.

iii. වැය විෂයය අංක 25-2507(15) ආසියා පැසිපික් කලාපයේ ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන (ආ.ස.බැ.) සඳහා රු.8,388,430ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එයින් රු. 904,900 ක් හෙවත් සියයට 11 ක් ඉතිරි වී තිබුණි.

3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු වසරකට වැඩි ණය ශේෂය රු. 192,880 ක් විය.

(ආ) සේවය අත හැර ගිය නිලධාරීන් තිදෙනකුගෙන් වසර 05 සිට වසර 12ක් දක්වා කාලයක් පුරා අය නොවී පවතින ණය ශේෂ එකතුව රු. 259,174 ක් වූ අතර විගණිත දිනය තෙක් මෙම ණය අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) 2023 මැයි 22 දින සිට සේවය අත හැර ගිය නිලධාරියකුගෙන් අය විය යුතු රු. 107,200 ක් වූ ණය ශේෂය ඇපකරුවන්ගෙන් හෝ අයකරගැනීමට විගණිත දිනය තෙක් කටයුතුකර නොතිබුණි.

3.3 පොදු තැන්පතු

2024 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමේ ඇතුළත් රු. 140,774 ක් වූ ශේෂ වර්ෂ 2 සිට වර්ෂ 5 දක්වා කාල පරාසයක සිට පැවතියද සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් එම ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නිරවුල් කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබාදීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් දත්ත වෙබ් අඩවියට උඩුගතකිරීම හා මුද්‍රණය කර මුදාහැරීම සිදු කරනු ලබන අතර ඒ සඳහා සංගණන හා සමීක්ෂණ ගණනාවක් තුලින් දත්ත රැස්කරනු ලබයි. එසේ වුවද, මුද්‍රණය කිරීමට නියමිතව තිබූ දත්ත වාර්තා 23 ක් නියමිත දිනට මුද්‍රණය කර නොතිබූ අතර උඩුගතකිරීමට නියමිතව තිබූ දත්ත වාර්තා 39 ක් 2025 අප්‍රේල් 02 දින දක්වාත් වෙබ් අඩවියට නිකුත් කර නොතිබුණ අතර දත්ත වාර්තා 19 ක් නියමිත දිනයට වඩා දින 07 ත් මාස 6 ත් අතර කාල පරාසයක ප්‍රමාදයකින් පසුව වෙබ් අඩවියට උඩුගතකර තිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රජා විඥාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයට (DHS) අදාල පරිගණක ආශ්‍රිත පෞද්ගලික තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ (CAPI System) කාර්යය අදාල අංශය සහ තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අංශය විසින් 100% ක ප්‍රගතියකින් ඉටු කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාල කටයුතු ආරම්භ කර නොතිබුණි. වසර 5කට වරක් සිදු කරනු ලබන මෙම සමීක්ෂණය අවසන් වරට 2016 වර්ෂයේදී සිදු කර තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සයිබර් ආරක්ෂණ සමීක්ෂණයේ මෘදුකාංග සංවර්ධනයට අදාල (Cyber Security Survey Software Development) කාර්යයන් තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අංශය සහ නියැදි සමීක්ෂණ අංශය මගින් 100% ක ප්‍රගතියකින් ඉටු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු ආරම්භ කර නොතිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොතිබීම

කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව දෙපාර්තමේන්තුවේ අංශ 07 කට අදාල කාර්යයන් 07 ක භෞතික ප්‍රගතික ප්‍රගතිය 15% - 40% අතර පරාසයක පැවැතුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) සර්වර් පරිගණක කාමරය (Server Room)

දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපාන සර්වර් පරිගණක කාමරයෙහි ස්ථාපිත කර ඇති අඛණ්ඩ උෂ්ණත්වය නියාමනය සඳහා අත්‍යවශ්‍ය (precision air cooling system) සිසිලන පද්ධති දෙකෙන් Teenair වර්ගයේ යන්ත්‍රය වසර 02ක සිට ක්‍රියාව පවතින අතර Liebert වර්ගයේ යන්ත්‍රයේ මාස 09ක පමණ සිට කාර්මික දෝෂයක් පවතින බවත් තාවකාලික සිසිලන අවශ්‍යතාවය සඳහා පවතින Frostair වර්ගයේ සාමාන්‍ය සිසිලන පද්ධතියද ක්‍රියාව පවතින බවත් නිරීක්ෂණය කෙරේ. තවද ඒ සඳහා විදුලි සම්බන්ධතා ලබා ගන්නා UPS යන්ත්‍රයේ වගකීම් කාලය ඉක්මවා ඇති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව, සර්වර් පරිගණක තුළ ඇති ජාතික වශයෙන් ඉතා වැදගත් දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට නිරීක්ෂණය කෙරේ.

(ආ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ස්ථාපිත UPS යන්ත්‍ර

දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනයට පෙර නිසි අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව 2014 දෙසැම්බර් 29 දින රු. 16,320,304 ක් ගෙවා UPS යන්ත්‍ර 18ක් මිලදී ගෙන තිබූ අතර මිල දී ගත් දින සිටම ක්‍රීය තත්ත්වයේ පවතින යන්ත්‍ර 02 ක් ඇතුළුව සියළු යන්ත්‍ර මේ වනවිට අක්‍රීය තත්ත්වයේ බව කිරීක්ෂණය වුණි. මේ සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. මෙම යන්ත්‍රවල සේවා කටයුතු සඳහා ගිවිසුම් 05ක් යටතේ රු.17,034,150ක් ගෙවා තිබුණි. ඒ අනුව, ජාතික වශයෙන් ඉතාමත් වැදගත් හා වටිනා දත්ත විශාල ප්‍රමාණයක් මෙහෙයවනු ලබන පරිගණක ඇතුලු වටිනා යන්ත්‍ර UPS යන්ත්‍ර නොමැතිව අනාරක්ෂිතව ක්‍රියාත්මකවන බවට විගණනයේදී අනාවරණය වුණි.

(ඇ) Laptop පරිගණක 10 ක් මිලදී ගැනීම

2023 දෙසැම්බර් 29 රු. 2,890,000 කට මිලදී ගෙන තිබූ ලැප්ටොප් පරිගණක 10 ක සාම්පල අදාල පිරිවිතර වලට අනුකූලතාවය පරීක්ෂාකර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර නොතිබුණු අතර සියළු පරිගණක දෙපාර්තමේන්තුවට ලැබීමෙන් පසු ඒවා දෙපාර්තමේන්තු පිරිවිතරයට අනුකූල නොවන බවට තොරතුරු තාක්ෂණ අංශය විසින් 2024 ජනවාරි 08 දින නිර්දේශකර තිබුණි. එසේ වුවද අදාල නිර්දේශ නොසලකා 2024 පෙබරවාරි16 සහ සැප්තැම්බර් 03 දිනවලදී සම්පූර්ණ වටිනාකම ගෙවීමට කටයුතු කර තිබුණි. තවද මෙම මිලදීගැනීම 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) 2017.06.28 දිනැති අංක 01/2017 දරන භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත්කරන ලද වත්කම් හා පිරිවැය කළමනාකරණ චක්‍රලේඛයේ 07 හා 08 ඡේද ප්‍රකාරව 2018 වසරේ සිට ආයතනයක් විසින් මිලදී ගන්නා ලද සහ අපහරණය කරන ලද වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාල කාර්තුව අවසානයේ දී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී අදාල චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඉ) 2018.12.31 දිනැති අංක 04/2018 දරන භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත්කරන ලද මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ ඇමුණුම 1 හි 3.3 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂ 5 කට වරක්ම කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සඳහා තක්සේරු වාර්තාවක් ලබාගත යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඊ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පවතින ප්‍රමාණාත්මක හා ඉක්මන් අවධානය යොමුවියයුතු අඩුපාඩු පිළිබඳව පසුගිය වර්ෂයේ කළමනාකරණ විගණන වාර්තාව මඟින් ඉදිරිපත් කළ ද වාර්තාවේ දිනය තෙක් ඒ පිළිබඳව කළමනාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

(උ) පසුගිය වර්ෂයේදීද මාගේ වාර්තාව මඟින් අනාවරණය කරනලද, මුද්‍රණ අංශය තුළ පවතින නිශ්ක්‍රීයව පවතින වායුසමීකරණ යන්ත්‍ර 40 ක් පිළිබඳව වාර්තාවේ දිනය තෙක් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලයට අනුව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන) තනතුරු 03 ක් පවතින අතර ඉන් එක් තනතුරක් 2021 ජූනි 01 දින සිටද තවත් තනතුරක් 2024 ජනවාරි 23 දින සිටද පුරප්පාඩුව පවතී. එසේ වුවද අදාල සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ සිටිය ද වාර්තාවේ දිනය තෙක් අදාල තනතුරුවල පුරප්පාඩු පුරවා සිය කාර්භාරය අපේක්ෂිත ආකාරයට ඉටුකිරීම සඳහා කළමනාකාරිත්වය විසින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 29 ක් හෙවත් පුරප්පාඩු 518 ක් පැවතුණි. එසේ වුවද, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුර146 ඇතුලු පුරප්පාඩු තනතුර පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට ආයතනය මේ දක්වා විධිමත් පියවර ගෙන නොතිබිණ.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වාර්ෂිකව ආයතනයේ අපේක්ෂිත නිමැවුම හා එහි ප්‍රගතිය මැනිය හැකි කාර්ය සාධන දර්ශක තුනක් හඳුනාගෙන ඇත. පසුගිය වසරට අදාලව එම දර්ශකවල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	දළ දේශීය නිෂ්පාදිතය (GDP) ඇතුළු සාර්ව ආර්ථික දර්ශක දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීමේ කැලැන්ඩරයට අනුව ප්‍රකාශයට පත් කිරීම	100		
2	ශ්‍රම වෙළඳපල දර්ශක (රැකියා නියුක්තිය හා රැකියා වියුක්තිය) විශේෂ දත්ත ප්‍රකාශයට පත්කිරීමේ සම්මතයන්ට අනුව ප්‍රකාශයට පත් කිරීම	100		
3	ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය අනුව අදාළ කටයුතු සිදු කිරීම	100		

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශය මඟින් පසුගිය වසර තුල සිදු කරන ලද කාර්යයන් මත පදනම්ව ගණනය කරන ලද කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පහත දක්වා ඇත.

01 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
II a	ඊ සංගණන සැලසුම් කටයුතු	100		
III a	CAPI පරිගණක පද්ධතිය සම්බන්ධ අත්පොත, පුහුණු මාර්ගෝපදේශය සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලි සකස් කිරීම, පරීක්ෂා කිරීම.	100		
b	උපදෙස් පොත්, පුහුණු මාර්ගෝපදේශය සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලි මුද්‍රණය කිරීම	100		
c	සියලුම දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත උපදෙස් පොත්, ආකෘති පත්‍ර, අනෙකුත් ලේඛන සහ උපකරණ ඇසුරුම් කිරීම සහ බෙදා හැරීම	100		
d	ගණන් ගැනීමේ අදියරෙහි නියමු සංගණනය	100		
e	ගණන් ගැනීමේ අදියර පුහුණු වැඩ සටහන	100		

1	ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩ සටහන	100		
2	දෙපාර්තමේන්තුවේ ඉහල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන	100		
3	දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් පුහුණු කිරීම	100		
4	දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියළුම නිලධාරීන් පුහුණු කිරීම (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර ඇති,)	100		
5	දිස්ත්‍රික්කයන්හි නිලධාරීන් පුහුණු කිරීම	100		
6	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ පුහුණු කටයුතු	100		
f	ප්‍රචාරක වැඩ සටහන - ගණන් ගැනීමේ කටයුතු	100		
I	මුද්‍රිත හා ඩිජිටල් මාධ්‍ය හරහා සංගණන ප්‍රචාරණය - ස්ටිකර්, පෝස්ටර්, ප්‍රවෘත්ති පත්‍ර ලිපි, වීඩියෝ, රූපවාහිනී හා රේඩියෝ දැන්වීම්, සමාජ ජාලා ආදිය.	100		
g	දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර කටයුතු හා සංශෝධන වටය	95		
i	දත්ත භාවිතා කරන්නන් සඳහා දත්ත ලබා දීම. (2012 ජන හා නිවාස සංගණන දත්ත මඟින්)	100		
CAPI - පරිගණක ආශ්‍රිත පුද්ගලික සම්මුඛ පරීක්ෂණ				

02 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය-2023	100		
2	වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය -2024	100		
3	මාසික කර්මාන්ත නිෂ්පාදන දර්ශකය 2023/2024	100		
4	ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය 2023/2024	100		
5	ව්‍යාපාර නාමාවලිය (SBR)	100		
6	පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය	100		
7	නව සංඛ්‍යාලේඛන පනත සකස් කිරීම	100		

03 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - (මහ කන්නය- 2023/24)	100		
2	වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - (යල කන්නය- 2024)	100		
3	ආර්ථික සංගණනය 2025/26 (කෘෂිකාර්මික කටයුතු)	100		
4	ගොඩගොවිතැන් සංඛ්‍යාලේඛන සකස් කිරීම මහ කන්නය - 2023/24	100		
5	ගොඩගොවිතැන් සංඛ්‍යාලේඛන සකස් කිරීම යල කන්නය - 2024	100		
6	අර්තාපල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - 2024	100		
7	ලොකු ඵැණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - 2024	100		
8	තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය - 2023/24	100		
9	තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය - 2024/25 (නියැදිය තේරීම)	100		
10	පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන සකස් කිරීම - 2024	100		
11	ආහාර ශේෂ පත්‍රය සකස් කිරීම - 2023	100		
12	බඩඉරිගු අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය (මහ)-2023/24- කුඩා කෘෂිකාර්මික ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP)	100		

04 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	ජාතික ගිණුම් වාර්ෂික වාර්තාව -2023 පිළියෙළ කිරීම, දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට නිකුත් කිරීම	95		
2	ජාතික ගිණුම් වැඩි දියුණු කිරීම සඳහා පවරා ඇති ක්‍රියාකාරකම් සිදුකිරීම, මාධ්‍ය සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීම		80	
3	2023 හතරවන කාර්තුව සහ වාර්ෂික ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
4	2024 පළමු කාර්තු සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
5	2024 දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
6	2024 තෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම.	100		
7	UN Year Book සඳහා දත්ත සැපයීම-2023	100		
8	දේශීය හා ජාත්‍යන්තර ආයතනවල දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම.	100		
9	ලොජිස්ටික් (logistics sector) අංශයේ සමාගම් සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීම. (ලොජිස්ටික් සමාගම් ලැයිස්තුවක් සංවර්ධනය කිරීම සහ ප්‍රශ්නාවලියක් සැලසුම් කිරීම)			20*
*අදාල ප්‍රශ්නාවලිය සකස්කර තොරතුරු තාක්ෂණික අංශයට ලබාදුන්නද ජන හා නිවාස සංගණනය - 2024 රාජකාරී නිසා එයට අදාල පරිසනක වැඩසටහන සකස් කිරීමට තොරතුරු තාක්ෂණික අංශයට නොහැකිවීම.				

05 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	සංඛ්‍යාන නිබන්ධනය -2024	100		
2	සංඛ්‍යාන අත්පොත - 2024 (ඉංග්‍රීසි)	100		
3	සංඛ්‍යාන අත්පොත - 2024 (සිංහල/දෙමළ)	100		
4	සංඛ්‍යාන දත්ත පත්‍රිකාව - 2024	100		
5	ආර්ථික දත්ත පොත - 2024	100		
6	පුවත් විවරණිකාව -2 වන වෙළුම 2023	100		
7	පුවත් විවරණිකාව - 1 වන වෙළුම 2024	100		
8	වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023	100		
9	ක්‍රියාකාරී සැලැස්ම 2024 පළමු හා දෙවන සංශෝධනය	100		
10	පළාත් පාලන සංඛ්‍යාලේඛන- 2023 සහ ගොඩනැගිලි සංඛ්‍යාලේඛන 2023/2024	100		
11	දුරකථන නාමාවලිය යාවත්කාලීන කිරීම	100		
12	දෙපාර්තමේන්තු ප්‍රකාශන බෙදාහැරීම	100		

06 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	පොත් බැඳීම් කටයුතු			15*
2	දෙපාර්තමේන්තු ප්‍රකාශන වල මෘදු පිටපත් පුස්තකාල දත්ත පද්ධතියට ඇතුලත් කිරීම.	100		
3	පුස්තකාල දත්ත පද්ධතිය නඩත්තු කිරීමේ කටයුතු	100		
4	දෙපාර්තමේන්තු විෂය පථයට අදාළ පුවත්පත් ලිපි ඩිජිටල් පුස්තකාල දත්ත පද්ධතියට ඇතුලත් කිරීම	100		
5	පුස්තකාල පොත් තොග සම්ක්ෂණය කිරීම	100		
6	පුස්තකාල පොත් මිලදී ගැනීම (මුද්‍රිත)			50**
7	පොත් බැහරදීමේ කටයුතු	100		

*මුද්‍රණ අංශයට ලබා දී ඇති භානියට පත් පොත් අලුත්වැඩියා කර පුස්තකාලයට ආපසු ලබා දී නොමැති අතර, භානියට පත් පොත් අලුත්වැඩියා කර පුස්තකාලයට ආපසු ලබා දීමට මුද්‍රණ අංශය පියවර ගනිමින් සිටී.

** මිලදී ගත යුතු පොත් ලැයිස්තුව ප්‍රසම්පාදන අංශයට යවන ලදී. කෙසේ වෙතත්, 2024.12.20 අවසානයේ පුස්තකාල අංශයට පොත් මිලදී ගත නොහැකි බවට ලිපියක් ලැබුණි. ප්‍රසම්පාදන අංශය පොත් මිලදී නොගත් බැවින්, මෙවර පොත් මිලදී ගැනීම් සිදු නොවීය. එබැවින්, ඒ සඳහා වෙන් කරන ලද මුදල් වෙනත් කිසිදු කටයුත්තක් සඳහා භාවිතා කිරීමට කාලයක් නොමැති බැවින් ඉතිරි වූ බව දන්වමි.

07 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	නිෂ්පාදකයාගේ මිල එකතු කිරීමේ (LPAP) සමීක්ෂණය (CAPI) -දත්ත ඇතුළත් කිරීමේ වැඩසටහන (2024)	100		
2	දිස්ත්‍රික් නාගරික මිල එකතු කිරීමේ සමීක්ෂණය	100		
3	ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - CAPI - 2024	100		
4	Vital Statistics දත්ත සැකසුම් පද්ධති නඩත්තුව	100		
5	CPH 2024 : Building Unit Listing (F1) මෘදුකාංග සංවර්ධනය	100		
6	CPH 2024 : Data Collection (F3) මෘදුකාංග සංවර්ධනය	100		
7	CPH 2024 : E - Census (මෘදුකාංග සංවර්ධනය සහ පරීක්ෂා කිරීම)	100		
8	CPH 2024 : E - Census දත්ත එක්රැස් කිරීම	100		
9	CPH 2024 : Census දත්ත සැකසීමේ කාර්යය	100		
10	CPH 2024 : F3 - විශේෂ ආයතනය සහ එළිමහන් ගණන් කිරීමේ පද්ධති සංවර්ධනය	100		
11	CPH 2024 : Internal Website (වැඩිදියුණු කිරීම් සහ නඩත්තුව)	100		
12	CPH 2024 : Public Website (සංවර්ධනය)	100		
13	CPH 2024 : ලැයිස්තුගත කිරීම සඳහා ආධාරක දත්ත සමුදාය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම	100		
14	MRCB (සංගණන වාරණ පිළිබඳ ප්‍රධාන ලේඛනය) දත්ත සමුදාය නඩත්තු කිරීම	100		
15	HIES (ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය) - CAPI මෘදුකාංග වැඩිදියුණු කිරීම්	100		
16	2023 දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම	100		
17	DCS ප්‍රධාන වෙබ් අඩවියට GDP තොරතුරු උඩුගත කිරීම	100		
18	DCS වෙබ් අඩවියට මිල දර්ශක උඩුගත කිරීම	100		
19	DCS වෙබ් අඩවියට නිෂ්පාදන කර්මාන්ත දර්ශකය සහ කර්මාන්ත තොරතුරු ඇතුළත් කිරීම	100		
20	SBR (සංඛ්‍යාන ව්‍යාපාර ලේඛනය) අධීක්ෂණය සහ නඩත්තුව	100		
21	SDG වෙබ් අඩවි නඩත්තුව	100		
22	නව DCS ප්‍රධාන වෙබ් අඩවිය - මෙහෙයුම් කටයුතු සහ නඩත්තුව	100		
23	Sever Room වැඩිදියුණු කිරීම	100		
24	පරිගණක ජාලය සහ ඒ සම්බන්ධ සයිබර් ආරක්ෂාව වැඩි දියුණු කිරීම	100		

25	පරිගණක නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම	100		
26	දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය සඳහා P1, H1, L1 පුහුණුව සහ යාවත්කාලීන කිරීම්	100		
27	පාසල් සංගණනය 2023 - අධ්‍යාපන අමාත්‍යාංශය	100		
28	සේවා නියුක්ති සංගණනය - දත්ත ඇතුළත් කිරීමේ වැඩසටහන් සංවර්ධනය	100		
29	KOHA Library System - නඩත්තු කිරීමේ කටයුතු සහ උපස්ථ ලබා ගැනීම	100		
30	CPH 2024 : L Form Preparation වැඩසටහන සංවර්ධනය	100		
31	CPH 2024 : F3 CAPI & BYOAD Assignments සැකසීම	100		
32	CPH 2024 : F3 SI -විශේෂ ආයතනයන්හි දත්ත ලබා ගැනීමේ වැඩසටහන සැකසීම	100		
33	CPH 2024 : සංගණන මෙහෙයුම් හා තාක්ෂණික මැදිරිය පවත්වාගෙන යාම	100		
34	Post Enumeration Survey (PES) - CAPI මෘදුකාංග වැඩසටහන සකස් කිරීම (PES - F1 , PES - F3)	100		
35	Post Enumeration Survey (PES) - Data Matching වැඩසටහන සැකසීම	100		
36	කෘෂිකර්ම සංගණනය 2025	100		

CAPI - පරිගණක ආශ්‍රිත පුද්ගලික සම්මුඛ පරීක්ෂණ
MRCB - සංගණන කාණ්ඩ රෙජිස්ට්‍රරය
CPH - ජන හා නිවාස සංගණනය

08 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	2024 වර්ෂයට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම	100		
2	තනතුරු ස්ථිර කිරීම	100		
3	පරිවාස කාලය දීර්ඝ කිරීම	100		
4	ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම	100		
5	වාර්ෂික වැටුප් වර්ධක නියෝග නිකුත් කිරීම	100		
6	වාර්ෂික කාර්ය සාධන ඇගයීම	100		
7	වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම	100		
8	විශ්‍රාම ගැන්වීම	100		
9	නඩත්තු ගිවිසුම් අළුත් කිරීම	100		
10	වාහන සේවා කිරීම	100		
11	ඉන්ධන පරිභෝජන පරීක්ෂණ	90		

09 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය	100		
2	ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය	100		
3	දත්ත නිකුත් කිරීම	100		
4	අන්තර් ජාතික ශ්‍රම සංඛ්‍යාලේඛනඥ වරුන්ගේ 19 වන සම්මේලනයේ දී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියමු සමීක්ෂණය (ICLS)	100		
5	පානීය ජලයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය	100		
6	ආර්ථික අර්බුධයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය 2023	100		
7	වැඩිහිටියන්ගේ දුන්කොල භාවිතය පිළිබඳ ගෝලීය සමීක්ෂණය (GATS) - 2019/20	100		

10 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
01	දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් සිදු කරන සංගණන හා සමීක්ෂණ වල ප්‍රකාශන, ආකෘති පත්‍ර මුද්‍රණය	100		

11 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා තාක්ෂණික හා පරිපාලනමය පහසුකම් සැපයීම	100		
2	දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික වැඩමුළු පැවැත්වීම			40*
3	දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම		80	
4	කාර්ය සාධනය සහ ප්‍රගතිය නිරීක්ෂණය සාකච්ඡා කිරීම සඳහා කමිටු රැස්වීම් පැවැත්වීම (ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත, කෘෂිකර්ම)			50**
5	අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු වල ඇති සංඛ්‍යාලේඛන අංශ සම්බන්ධීකරණය සහ ඇගයීම	100		
*දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ පලමු වාර්ෂික වැඩමුළුව 2024 ජුනි 28 දින Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට සියලු කටයුතු සැලසුම් කළද ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සර්වර් පද්ධතිය, අන්තර්ජාල සහ විදුලිය බිඳවැටීම් නිසා 4 වන කාර්තුව දක්වා කල් දමන ලදි. නමුත් ජන හා නිවාස සංගණනය 2024 ගණන් ගැනීමේ අදියර ක්ෂේත්‍ර රාජකාරිවල දිස්ත්‍රික් අංශ ප්‍රධානීන් නිරත වීම නිසා කලින් සැලසුම් කළ පරිදි 4 වන කාර්තුවේද මෙම වැඩමුළුව පැවැත්වීමට නොහැකි විය.				
** ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත හා කෘෂිකර්ම කමිටු සාමාජිකයන් ජන හා නිවාස සංගණනය 2024 ගණන් ගැනීමේ අදියර ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වීම නිසා දෙවන කමිටු රැස්වීම් සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි විය.				

12 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	දෙපාර්තමේන්තුවේ ආචාර්ය උපාධි / පශ්චාත්උපාධි හදාරන්නන් සඳහා ප්‍රතිපාදන ලබාදීම			60
2	සංඛ්‍යාන කාර්ය මණ්ඩලයේ වෘත්තිය කුසලතා හා මෘදු කුසලතා සංවර්ධන සඳහා දෙපාර්තමේන්තුව තුළ හා පිටත කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම			60
3	දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතු නිලධාරීන් සඳහා සිංහල / දෙමළ භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම			60
4	දෙපාර්තමේන්තුවේ සහායක කාර්ය මණ්ඩලය සඳහා දෙපාර්තමේන්තුව තුල හා පිටත කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම (කළමණාකරන සහකාර, මුද්‍රණ අංශ නිලධාරීන්,රියදුරු,කාර්යාල සහායක)			40
5	පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය නිලධාරීන්, පොදු මහජනතාව අතර සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම			60
6	දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මාර්ග ගත ක්‍රමයට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	100		

15 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ සංගණන ආකෘති පත්‍ර/ කේත ලැයිස්තු/ උපදෙස් මුද්‍රණය කිරීම	100		
2	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ පුහුණු කිරීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	100		
3	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ සංගණන ලේඛන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සියලු ආයතන වෙත බෙදාහැරීම	100		
4	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ සංගණන දත්ත රැස් කිරීම	100		
5	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ සංගණන ලේඛන එක්රැස් කිරීම		88	
6	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ දත්ත සැකසීම	95		
7	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ දත්ත ව්‍යාප්ත කිරීම	93		
8	පශ්චාත් ගණන් ගැනීමේ සමීක්ෂණයේ (PES) මූලික සැලසුම් කටයුතු සිදුකිරීම	100		
9	පශ්චාත් ගණන් ගැනීමේ සමීක්ෂණයේ නියමු සමීක්ෂණය පැවැත්වීම	100		
10	ද්විවාර්ෂික සම-සමාලෝචනය කරන ලද පර්යේෂණ සඟරාවක් වන "Sri Lanka Statistics Review" (SSR) ප්‍රකාශයට පත් කිරීම	95		
11	සංඛ්‍යාලේඛන සම්බන්ධ වාර්ෂික සඟරාව (දිශානති) නිකුත් කිරීම			25*
12	ළමා සංඛ්‍යානි සම්බන්ධ වෙබ් පිටුව යාවත්කාලීනව පවත්වාගෙන යාම	100		
13	ස්ත්‍රී/ පුරුෂභාවයට අදාළ සංඛ්‍යානි ඇතුළත් වෙබ් පිටුව යාවත්කාලීනව පවත්වාගෙන යාම	100		
14	අනෙකුත් රාජ්‍ය ආයතනවලට අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම	100		
15	දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළ දත්ත මුදා හැරීමේ ඉදිරි දින සටහන යාවත්කාලීනව පවත්වාගෙන යාම	100		
*ලිපි/වාර්තා අපේක්ෂා කළ පරිදි නොලැබුණු බැවින්, අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය.				

16 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය	100		
2	දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් රැස් කිරීමේ වැඩ සටහන	100		
3	නිෂ්පාදකයාගේ මිල දර්ශකයට සේවා අංශය එකතු කිරීම (PPI)	100		
4	කෘෂිකර්මාන්ත, නිෂ්පාදන කර්මාන්ත හා උපයෝගිතා අංශ වල මිල ගණන් රැස් කිරීමේ වැඩ සටහන	100		
5	ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) ගණනය කිරීම (පාද වර්ෂය : 2021 = 100)	100		
6	කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) ගණනය කිරීම (පාද වර්ෂය : 2021 = 100)	100		
7	නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) ගණනය කිරීම (පාද වර්ෂය : 2018, Q4 = 100)	100		
8	මිල දත්ත බෙදා හැරීම සිල්ලර මිල තොරතුරු හා නිෂ්පාදකයාගේ මිල තොරතුරු ඇතුළත් විවර්ණිකාව 2020 - 2023	100		
9	රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, ත්‍රිවිධ හමුදා නිළධාරීන්ගේ සහ අනෙකුත් තරාතිරම් වල හමුදා අයවළුන්ගේ සලාක වටිනාකම මාසිකව ගණනය කිරීම	100		
10	ආසියා පැසිපික් කළාපයේ ජාත්‍යන්තර මිල සංසන්දනාත්මක වැඩසටහන (ICP) - 2024	100		

18 අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	සිතියම් සකස් කිරීමේ දී ඇති ප්‍රායෝගික ගැටළු හා පරිපාලනමය ගැටළු දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගැනීම.	100		
2	අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු භාවිතා කරනු ලබන කුඩාම පරිපාලන ඒකක සම්බන්ධව විමර්ශනය කිරීම.	100		
2.1	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ භූගෝලීය දත්ත පද්ධතිය සංසන්දනය කර නිවැරදි කිරීම් සිදුකිරීම.	100		
2.2	ශ්‍රී ලංකා පොලීසියට හා සෞඛ්‍ය සේවා ප්‍රදේශවලට අදාලව භූගෝලීය දත්ත පද්ධතිය සකස් කිරීම.	100		
2.3	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාලව භූගෝලීය දත්ත පද්ධතිය සකස් කිරීම.	100		
2.4	අධ්‍යාපන කලාපවලට අදාලව භූගෝලීය දත්ත පද්ධතිය සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශයට ලබාදීම. (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අදාල කොටස සම්පූර්ණ කර ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව අධ්‍යාපන කලාප සීමානීරණ කටයුතු අවසන් වන තුරු කල් දමා ඇත.)	100		
2.5	අධිකරණ බල ප්‍රදේශවලට අදාලව භූගෝලීය දත්ත පද්ධතිය සකස් කිරීම. (දිස්ත්‍රික්ක 12 කට අදාල කටයුතු අවසන් කිරීම)	100		
3	දිස්ත්‍රික් මට්ටමින් සිතියම් මුද්‍රණය කර දිස්ත්‍රික් කාර්යාල වෙත ලබාදීම.	100		
4	දිස්ත්‍රික් සඳහා සකස් කරන ලද භූගෝලීය දත්ත පද්ධති ඒකාබද්ධ කර ජාතික මට්ටමින් දත්ත පද්ධතිය සැකසීම.	100		
5	MRCB දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම	100		
6	ග්‍රාම නිලධාරී කොට්ඨාස සම්බන්ධ වාර්තාවක් සැකසීම හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලබාදීම.		80	
7	සංගණන කාණ්ඩ සිතියම් පරිලෝකනය කිරීම.	96		

තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඒකකය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක මත දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම				
1	a) ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම	100		
2	b) එක්සත් ජාතීන්ගේ සංශෝධනවලට අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ රාමුව යාවත්කාලීන කිරීම	100		
3	c) වෙනත් ආයතන විසින් සම්පාදනය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක හෝ ප්‍රොක්සි දර්ශක වලංගුකරණය	100		
4	d) ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට අනුකූලව තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක හෝ ප්‍රොක්සි දර්ශක සම්පාදනය කිරීම සඳහා තිරසර සංවර්ධන සභාව සහ අනෙකුත් නියෝජිතායතනවලට තාක්ෂණික සහාය ලබා දීම	100		
5	2. තිරසර සංවර්ධන සභාව විසින් සංවිධානය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ ආශ්‍රිත රැස්වීම් සහ වැඩමුළුවලට සහභාගී වීම	100		
6	3 a. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක ඇතුළත් දත්ත පත්‍රිකාවක් සකස් කිරීම සහ ප්‍රකාශනය කිරීම	90		
අන්තර්ජාතික සංඛ්‍යාලේඛන ක්‍රියාකාරකම්				
7	1. අන්තර්ජාතික සංඛ්‍යාලේඛනයන්හි සමස්ත සම්බන්ධීකරණය සහ කළමනාකරණය			15*
8	2. ඇතැම් දර්ශක සහ සංඛ්‍යාලේඛන සඳහා ජාත්‍යන්තර වාර්තාකරණය			15*
*මෙම කාර්යයන් (අන්තර්ජාතික සංඛ්‍යාලේඛන කටයුතු) 2024 පෙබරවාරි මාසයෙන් පසු දත්ත නිකුත් කිරීමේ ඒකකය වෙත පවරා ඇත.				

දත්ත නිකුත් කිරීමේ ඒකකය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	ක්ෂුද්‍ර දත්ත ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම	100		
2	වෙනත් ආයතන/පුද්ගලයින් විසින් කරනු ලබන දත්ත ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම	100		
3	තොරතුරු දැනගැනීමේ පනතට අනුව ලැබෙන තොරතුරු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම	100		
4	දෙපාර්තමේන්තු මුද්‍රිත ප්‍රකාශනයන් දත්ත භාවිත කරන්නන්ට හා පර්යේෂකයන්ට අලෙවි කිරීම	100		
5	ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ, පාර්ලිමේන්තු කමිටු, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් ඉල්ලීම් කරනු ලබන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා ප්‍රතිචාර දැක්වීම	100		

සංඛ්‍යාන සංවර්ධන සහ ජාත්‍යන්තර සහයෝගීතා ඒකකය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	සංඛ්‍යාලේඛන සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා උපායමාර්ගය සකස් කිරීම	90		

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - ජීව සංඛ්‍යාලේඛන අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීම - 2024	100		
2	උපත්, විවාහ සහ මරණ සංඛ්‍යාව ගණනය කිරීම - 2023	100		
3	දත්ත භාවිතා කරන්නන්ට අවශ්‍ය දත්ත ලබා දීම	100		

කම්කරු සංඛ්‍යාලේඛන අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	"කම්කරු සංඛ්‍යානි 2023" වාර්ෂික වාර්තාව සකස් කිරීම	100		
2	"පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය -2022" වාර්තාව සකස් කිරීම	100		
3	"වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය 2023" සමීක්ෂණය පැවැත්වීම හා වාර්තාව සකස් කිරීම	90		
4	"වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය 2024" සමීක්ෂණය පැවැත්වීම	95		
5	"ILO" වාර්ෂික වාර්තාව සඳහා දත්ත ලබා දීම	95		
6	6.1 2023 වර්ෂය සඳහා ශ්‍රම වෙලෙඳ පොල ප්‍රධාන දර්ශකාංක ගණනය කිරීම	100		
	6.2 අවම වැටුප් අනුපාත දර්ශකය සකස් කිරීම	100		
	6.3 සේවක සහරාව සඳහා දත්ත ලබා දීම	100		
	6.4 පෞද්ගලික අංශයේ වැඩ වර්ජන පිළිබඳ දත්ත ලබා දීම	100		
	6.5 සංඛ්‍යාන නිබන්ධනය සඳහා දත්ත ලබා දීම	100		
7	"කම්කරු වෙළඳපොල ප්‍රධාන දර්ශක 2023" වාර්තාව සකස් කිරීම	100		
8	සේවක අර්ථ සාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම හා වැඩිදියුණු කිරීම	100		

ධීවර අමාත්‍යාංශය -සංඛ්‍යාලේඛන අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	වෙරළ කලාප සහ ගැඹුරුදිය මත්ස්‍ය නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම.	100		
2	මිරිදිය සහ ජල ජීවී වගා නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම.	100		
3	මත්ස්‍ය සහ කරවල තොග මිල ගණන් සහ පාරිභෝගික මිල ගණන් සැකසීම.	100		
4	මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයන හා අපනයන දත්ත සැකසීම.	100		
5	ධීවර සංඛ්‍යාලේඛන - 2024 යාවත්කාලීන වාර්තාව සකස් කර ඇත. මෘදු පිටපතක් ලෙස දත්ත වාර්තාව පවතියි.	95		
6	දත්ත ලබා දීම. I. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (කෘෂිකර්ම දත්ත, ආහාර ශේෂ පත්‍රය, සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත, ජාතික ගිණුම් II. ශ්‍රී ලංකා මහ බැංකුව III. ඉන්දියානු සාගර ටූනා කොමිසම (IOTC) IV. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)	100		
7	අයිස් යන්ත්‍රාගාර සහ ශීතාගාර පිළිබඳ සමීක්ෂණය 2023 මූලික තොරතුරු රැස්කරමින් සමීක්ෂණ රාමුව යාවත්කාලීන කර ඇත.	100		
8	ටින් මාළු පිළිබඳ සමීක්ෂණය 2024 දේශීය ටින් මාළු නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු අදාළ දේශීය නිෂ්පාදකයින් වෙතින් රැස් කර ඇත. ටින් මාලු වෙළඳපොළ මිල ගණන් පිළිබඳ තොරතුරු වෙළඳපොළ සමීක්ෂණයක් හරහා රැස් කර අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා ලබා දී ඇත.	100		
9	වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම සඳහා වන දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ධීවර දෙපාර්තමේන්තුව සහ නාරා ආයතනය සමඟ ඒකාබද්ධව වැඩිදියුණු කිරීම. දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් 2024 වසර සඳහා සැලසුම් කරන ලද කාර්යයන් සපුරාලීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දී ඇත (දත්ත වාර්තා කිරීම සඳහා අවශ්‍ය ආකෘති සැකසීම, දත්ත රැස්කරන නිලධාරීන් පුහුණු කිරීම, තොටුපළ ලැයිස්තුව යාවත්කාලීන කිරීම, නියැදී සැලස්ම සැකසීම ආදීය)	100		

10	කරවල නිෂ්පාදනය සම්බන්ධයෙන් දත්ත රැස්කිරීම කරවල නිෂ්පාදනය සම්බන්ධයෙන් ක්ෂේත්‍රයෙන් දත්ත එක් රැස්කර නොවැම්බර් මාසය දක්වා මාසික ඇස්තමේන්තු සකස්කර ඇත.	92		
11	ක්‍රියාකාරී ධීවරයින් සහ ක්‍රියාකාරී ධීවර යාත්‍රා සම්බන්ධයෙන් දත්ත ක්ෂේත්‍රයෙන් රැස්කර පරිගණකගත කර වාර්ෂික ඇස්තමේන්තු සැකසීම සඳහා සූදානම් කර ඇත.	95		

සෞඛ්‍යය අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය				
අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	89% - 75%	74% - 50%
1	සෞඛ්‍ය වෛද්‍ය කොට්ඨාස මට්ටමින් 2024 වර්ෂය සඳහා ජනගහන ඇස්තමේන්තු කිරීම	100		
2	ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීම	100		
3	පුහුණු වැඩසටහන් පැවැත්වීම - රෝහල් සංඛ්‍යාලේඛන කාර්යයේ නිරත කාර්ය මණ්ඩලය සඳහා රෝහල් සංඛ්‍යාලේඛන හා eIMMR පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයිනේ සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශ ආවරණය වන පරිදි පැවැත්වීම	100		
4	වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම - 2022-2023	100		
5	දත්ත ඉල්ලීම් සඳහා අදාළ පරිදි දත්ත ලබා දීම	90		
6	දත්ත කේත කිරීම/නිවැරදිතාව පරීක්ෂා කිරීම/ දත්ත පරිගණක ගත කිරීම			50

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදළ තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේ ක්‍රියාවලියේදී අරමුණු අංක 17 යටතේ ඇති ඉලක්ක 17.18 ළඟා කර ගැනීම සම්බන්ධ වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සතුව ඇත. ඒ යටතේ ඇති 17.18.2 සහ 17.18.3 දර්ශක දෙපාර්තමේන්තුව මඟින් හඳුනාගෙන ඇත.

මීට අමතරව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමේ ක්‍රියාවලියේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යභාරය වනුයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ මත පදනම්ව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය ඉලක්ක වෙත ලඟා වීම මැනබැලීම සඳහා අවශ්‍ය දර්ශක සම්පාදනය කර ලබා දීමයි.

ඒ අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක 38 ක් සඳහා දෙපාර්තමේන්තුව මඟින් මේ වනවිට දත්ත සම්පාදනය කර ඇති අතර 2024 වර්ෂයේදී ඒ අතුරින් දර්ශක 12 සඳහා යාවත්කාලීන දත්ත සකස්කිරීමේ කටයුතු සිදුකොට ඇත. මීට අමතරව නව දර්ශක 2ක් සහ ප්‍රොක්සි දර්ශක 2ක් සඳහා දත්ත සම්පාදනය කර ඇති අතර එම දර්ශක හා එහි ප්‍රගතිය පහත වගුව මඟින් ඉදිරිපත් කර ඇත.

ඉලක්ක/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
අරමුණු 01- සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.4 විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.	1.4.1 මූලික සේවාවන් සහිත කුටුම්භයන්හි ජීවත්වන ජනගහනයේ අනුපාතිකය **ප්‍රොක්සි දර්ශකය:** මූලික පානීය ජල සේවා සහිත කුටුම්භයන්හි ජීවත්වන ජනගහනයේ අනුපාතිකය			100*

අරමුණු 03- නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	3.8 මූල්‍යමය අවධානමට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලු දෙනාටම ලබා ගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම	3.8.1 අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ආවරණය **ප්‍රොක්සි දර්ශකය:** වැඩි දියුණු සනීපාරක්ෂක පහසුකම් භාවිතය			100*
අරමුණු 04- පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාල කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම	4.4.1 කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවෙන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහනයේ අනුපාතිකය			100*
අරමුණු 05- ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	5.5 දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගි වීම තහවුරු කිරීම	5.5.2 විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ අනුපාතිකය			100*

